# 2023-01-04 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
# විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**මෙදින පෙ.ව.10.15 ට පමණ විශේෂ මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| **1.** | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති |
| **2.** | ආර්.ධනරත්න මැතිතුමා | සභික |
| **3.** | ඩබ්ලිව්. අශෝක ගුණරත්න මැතිතුමා | **සභික** |
| **4.** | අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා | **සභික** |
| **5.** | එස්.කරුණාදාස මැතිතුමා | **සභික** |
| **6.** | ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා | **සභික** |
| **7.** | ආරියවංශ පල්ලෙවෙල මැතිතුමා | **සභික** |
| **8.** | එච්.සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | **සභික** |
| **9.** | ඩී.චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා | **සභික** |
| **10.** | ජී.එම්.දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා | **සභික** |
| **11.** | **ආර්.ඒ.නන්දසේන මැතිතුමා** | **සභික** |
| **12.** | එස්.එල්.ඩී.ශිරාන් සමරතුංග මැතිතුමා | **සභික** |
| **13.** | එස්.එම්.සේනාධීර මැතිණිය | **සභික** |
| **14.** | රසිකා වසන්ති සිරිවර්ධන මැතිණිය | **සභික** |
| **15.** | සනත් ප්‍රියන්ත සිරිසේන මැතිතුමා | **සභික** |
| **16.** | රේවතී නන්දා මැතිණිය | **සභික** |
| **17.** | යූ.එල්.නුවන් මහේෂ් රත්නායක මැතිතුමා | **සභික** |
| **18.** | **ඩබ්.වී.ඩබ්.ජේමචන්ද්‍ර මැතිතුමා** | **සභික** |

**නොපැමිණි**

| | | |
|---|---|---|
| 01 | ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා | **සභික** |
| 02 | මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා | **සභික** |
| 03 | ආර්.කේ.මොහොමඩ් රාෆි මැතිතුමා | **සභික** |
| 04 | එච්.කේ. කුමුදු නිල්මිණී රේණුකා මැතිණිය | **සභික** |
| 05 | කේ.ගයානි ප්‍රියදර්ශනී කුමාරගේ මැතිණිය | **සභික** |
| 06 | එම්.ඒ.චානක විජේරත්න මැතිතුමා | **සභික** |
| 07 | පී.යූ.සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය | **සභික** |
| 08 | කේ.ඒ.නයනි කස්තුරිආරච්චි මැතිණිය | **සභික** |
| 09 | සුගත් හෙන්ඩ්‍රි හැන්ඩ්‍රිසන් මැතිතුමා | **සභික** |
| 10 | ඩබ්ලිව්. තිලක් පුෂ්ප කුමාර මැතිතුමා | **සභික** |
| 11 | රසිකා අරුණකාන්ති මැතිනිය | **සභික** |
| 12 | එච්.ටී.තිලකරත්න මැතිතුමා | **සභික** |

**01. ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා - ලේකම්**

ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය.

**සභාපතිතුමා :-**

සුභ උදෑසනක්. වාසනාවන්ත නිරෝගීමත් අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. අද දින විශේෂ මහා සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ගෞරවයෙන් පිළිගනු ලබනවා. අද දින විශේෂ සභාව පැවැත්වීමට හේතුව වූයේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සඳහා විධිමත් සභා අනුමැතියක් ලබා ගැනීම සඳහායි.

සභාපතිතුමා:-

ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා :-**

එම යෝජනාව ස්ථිර කරනවා.අනිවාර්යයෙන්ම මේ රටේ දුප්පත් අහිංසක ජනතාවට ආර්ථික අපහසුතා මධ්‍යයේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සිදු කරනු ලබන මෙම සත්භාවයට අපේ ගෞරවය මම පුද කරනවා.

**සභික පී.ආරියවංශ මැතිතුමා :-**

ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත මෙම යෝජනාව සිදුකිරීම පිළිබඳව මම ගරු ආණ්ඩුකාරතුමාට මෙන්ම සභාවේ ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. අද වන විට මේ රටෙහි දරිද්‍රතාවයකින් පෙළෙන දූප්පත් පන්තියේ දරුවන් වෙනුවෙන් සමාජයේ කල යුතු ඉහළම සත්කාරය මෙම දරුවන්ට පාසල් යාමට පොත් පත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමයි.මෙම දූප්පත් පංතියේ දරුවන් සාමාන්‍ය අධ්‍යාපනය නොමැතිව සමාජගත වුවහොත් සමාජයට විශාල හානියක් අපහසුතාවයක් ඇති වීමට ඉඩ තිබෙනවා. සාමාන්‍ය අධ්‍යාපනය යනු දරුවන්ට ලැබෙන වැදගත්ම අවස්ථාවක්. සාමාන්‍ය අධ්‍යාපනය නොමැති යම්කිසි පුද්ගලයෙක් ධනයෙන් ආඩ්‍ය වී අත්සන් කිරීමටවත් නොදැන, එම ධනය උපයාගෙන, ඉන් ලබා ගන්නා ප්‍රයෝජන ඉතාම අල්පයි. සාමාන්‍ය අධ්‍යාපනය ලැබූ දරුවෙක් යම් කිසි ස්ථානයකට පැමිණි විට ඔහුගේ මුදල් කළමනාකරණය හා අනිකුත් දේවල් තුළින් ඉතාමත් සශ්‍රීක ලෙස සමාජයට දායකත්වය ලබා දෙනවා.එම නිසා මෙම යෝජනාවට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමින් එය නිසි ආකාරයෙන් ඉටුවනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

**සභාපතිතුමා:-**

මෙම සත්කාරය සඳහා අපට මිලියන 10ක මුදලක් වැය කිරීමට සිදුවෙනවා. එම මුදල අපේ ස්ථිර තැන්පතුවකින් ලබාගැනීමට හැකියාව තිබෙනවා. ඒ සඳහාත් අනුමැතිය ලබාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා. මෙය පක්ෂ ,පාට,ජාති,ආගම් නොසලකා සත්භාවයෙන්ම සිදුකල යුතු කාරණයක්. සමහර රාජ්‍ය නිලධාරීන් යම් යම් හානිදායක තත්වයක් ඇති කලහොත් ,එය අපගේ අතට රැගෙන හෝ අවංකව සිදුකිරීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**සභික චමිල් දිසානායක මැතිතුමා:-**

අපි පිළිගන්නවා මෙය ඉතාම හොඳ කාර්යයක් බව. බෝපැත්ත පිරිවෙන සඳහාත් පොත් ලබාදීමට අපේ යෝජනාවක් තිබුණා.නමුත් එම ස්වාමීන් වහන්සේ පවසා සිටියා අවශ්‍ය තරම් පොත් තිබෙන බව.එම නිසා එම පොත් වෙනත් පාසලකට ලබාදෙන ලෙස පැවසුවා.

**සභාපතිතුමා:-**

මටත් එය පැවසුවා. එම ස්වාමීන් වහන්සේට අපගේ ගෞරවය පුදකර සිටිනවා.

**සභික නුවන් මහේෂ් රත්නායක මැතිතුමා:-**

හොඳ යෝජනාවක්.මගේ අදහස පාසල්වල විදුහල්පතිවරුන් හරහා තෝරාගත හැකිනම් හොඳයි. මක් නිසාද රජයේ ලේඛන සඳහා ගියොතින් ලැබිය යුතු අයට නොවෙයි ලැබෙන්නේ.

**සභාපතිතුමා:-**

කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා හරහා සියලුම පාසල් වල විදුහල්පතිතුමන්ලා දැනුවක් කර ,එම පාසල් වලින් මේවන විට සියලුම විස්තර ලබාගෙන තිබෙනවා. ඊට අමතරව බුළුගහපිටිය විද්‍යායතන පිරිවෙනින් එහි පරිවේනාධිපති ගෞරවනීය ස්වාමීන් වහන්සේට කතා කර එම ශිෂ්‍ය සංඛ්‍යාවට අවශ්‍ය අධ්‍යාපන උපකරණ ප්‍රමාණය කොපමණද කියා මේවන විට ලබාගෙන තිබෙනවා. අපට ඉල්ලුම්පත්‍රයක් තිබෙනවා. ග්‍රාම නිලධාරීතුමා සහ විදුහල්පතිතුමා අත්සන් කරලා තමයි නිකුත් කරන්න තිබෙන්නේ.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

එම යෝජනාවට අපි එකඟයි.පක්ෂයි.නමුත් මෙම යෝජනාව පැමිණි ආකාරය තමයි ගැටළුවකට තිබෙන්නේ. ආණ්ඩුකාරතුමාගේ මිනිස්සු නෙවෙයි මෙතන ඉන්නේ.මිනිසුන් පත්කළ ජනතා සේවකයින් මෙතන සිටින්නේ. ජනතා සේවකයාගේ ජනතා වුවමනා ඉටුකරගැනීමට ආණ්ඩුකාරතුමා දෙන්නේ නැතුව,එම මුදල් වියදම් නොකරන ලෙස කියා චක්‍රලේඛන නිකුත්කර, අපි නිකන් එයාලගේ අතකොලු බවට පත්කරගෙන සිටින්නේ. ඒ කියන්නේ ආණ්ඩුකාරතුමාට අවශ්‍ය දේ තමා අපි මේ සභාව තුළ සිදුකල යුත්තේ.මම අත් දෙකම උස්සනවා මෙම ගැටළුවට.නමුත් සභාපතිතුමායි මන්ත්‍රීතුමන්ලායි හැල්ලු කරලා තියෙන්නේ. සභාව තීන්දුවක් ගන්න නොහැකිව නොවෙයිනේ අපි සිටින්නේ.අපිට තීන්දුවක් ගන්න බැරුව අපේ මුදල් ස්ථිරව තබාගන්න කියා එතුමා යෝජනා කරනවා මෙය සිදුකරන ලෙස.අපි මොකටද මන්ත්‍රීවරු ලෙස පත්වන්නේ. ආණ්ඩුකාරතුමාට අවශ්‍ය දේ කරන්න ආණ්ඩුකාරතුමා පමණක් සිටියාම ඇතිනේ. මම මෙයට අනුමැතිය ලබා දෙනවා. නමුත් මෙම මන්ත්‍රීතුමන්ලාට හා ජනතාවට සිදුකරන කෙනෙහෙලිකම නැවැත්විය යුතුයි.මෙම බලධාරීන්ට විරුද්ධව අප නැගී සිටිය යුතුයි.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

යම් ප්‍රමාණයක ඇත්තක් තිබෙනවා.සභාවේ ගන්නා තීන්දුවක් ආණ්ඩුකාරතුමා එවන්න අවශ්‍ය නැහැ. අපිට එම තීන්දුව ගන්න අවස්ථාව ලබාදුන්නා නම් හරි අගෙයි. නමුත් අපි එතුමාටත් එම ගෞරවය පුදකරනවා.

**සභාපතිතුමා:-**

ජාතික මට්ටමින් රාජ්‍ය මුදල් වැය කිරීම සම්බන්ධව යම් යම් රෙගුලාසි පනවා තිබෙන අවස්ථාවක ගරු ආණ්ඩුකාරතුමා මෙම දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ දරුවන් වෙනුවෙන් මෙම තීන්දු රැගෙන තිබෙනවා.ඒ අනුව අපි යෝජනා ස්ථිර කර යවන්නේ.අපි සියලුදෙනාටම එහි ගෞරවය හිමි වෙනවා.

**සභික රේවතී නන්දා මැතිනිය:-**
ගරු ආණ්ඩුකාරතුමාගේ මැදිහත් වීම මත ,ගරු සභාපතිතුමාගේත් ලේකම්තුමාගේත් ඉල්ලීම මත ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීතුමන්ලා කටයුතු කිරීම පිළිබඳව අගය කරනවා. හේතුව අද ආර්ථික වශයෙන් බැට කන පීඩිත ජනතාවක් ගම තුළ සිටින්නේ. එම නිසා මෙම ගත්තා වූ උත්සාහයට සතුටට පත්වන බව ප්‍රකාශ කරනවා.

**සභික මනෝරි සේනාධීර මැතිනිය:-**
අපි ඉල්ලා තිබුනේ වෙන වෙන වැඩ. නමුත් එතුමා ඒ සියල්ලම අතහැර දමා මෙම ළමයි වෙනුවෙන් එම මුදල් බෙදා දීම පිළිබඳව එතුමාට ස්තූතිවන්ත වෙනවා.එමෙන්ම අපි විදුහල්පතිතුමන්ලාගෙන් එම නම් ලැයිස්තුව ලබාගත් විට ඔවුන් සියල්ලන්ටම එක සමානව බෙදී යනවා නේද?

**සභාපතිතුමා:-**
පංති මට්ටමින් වෙන් වෙන් වශයෙන් නම් ලැයිස්තුව එවා තිබෙනවා.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**
මෙම යෝජනාව ඒකමතිකව ස්ථිර වුණා. නමුත් මෙය කෙටි කාලීනයි. ලබන වසරේත් අපිට මෙම කාර්ය සිදුකිරීමට බැහැ. ඒ සඳහා අදාල බදු මුදල් අඩුකර දී දීර්ඝ කාලීනව පාසල් උපකරණවල මිල ගණන් අඩු කිරීමට වැඩපිළිවෙලක් රජය විසින් හඳුන්වා දිය යුතුයි.එමෙන්ම මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානත් මේවන විට දැඩි අපහසුතාවයට පත්ව තිබෙනවා.හැකිනම් පෙර පාසල් දරුවන්වත් මේ අවස්ථාවට සහභාගී කරගමු කියා මගේ අදහසක් ලෙස මෙය ඉදිරිපත් කරනවා.

සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා:-
අලුතින් පාසල් සඳහා ඇතුලත්කරගන්නා ළමුන්ටත් මෙම අවස්ථාව හිමි වෙනවාද?

සභාපතිතුමා:-
2023 වසරට ළමුන් ඇතුලත්කරගෙන තිබෙන්නේ. ඔවුන්වත් මෙයට ඇතුලත් වෙනවා. නැවතත් මම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් විමසා බලන්නම්.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභාපතිතුමා :-**
අද දින විශේෂ මහා සභාවට ගෞරවාන්විතව සහභාගී වී මෙම යෝජනාව සභා සම්මත කරදීම සම්බන්ධව ඔබතුමන්ලාට සහ ඔබතුමියන්ලාට ස්තූතිවන්ත වෙමින් .ඔබ සියලුම දෙනාට සුබම සුබ අලුත් අවුරුද්දක් පතමින් මෙම ගෞරවනීය සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. දැන් වේලාව පෙ.ව11.10යි.

රුවන් ලියනගේ,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.